



# අපගේ දේවසේවය වෙනස් කරවන අරමුණ

*දේවසේවය කිරීමට අපගේ උත්සහයන් අන් අයට ගැඹුරු පෞද්ගලික හැරීමක් ලභාකරගැනීම සඳහා සහ ගැලවුම්කරුවාණන් මෙන් වීමට උදව් කරනා අභිප්‍රායෙන් කළ යුතුය.*

ගැලවුම්කරුවාණන් කළ ලෙස අපි අන් අයට ප්‍රේම කිරීමේදී, උන්වහන්සේ කළ අකාරයටම ඔවුන්ට උදව් කරන්නට අපට උවමනා වනු ඇත. යහපත් එඬේරාණන් ලෙස, දේවසේවයේ අර්ථය සඳහා මූලිකම උදාහරණය උන්වහන්සේයි.

අපගේ දේවසේවය උන්වහන්සේ මෙන් හැඩගස්වාගැනීමට නම්, ඉතා ඉක්මන් අවශ්‍යතාවයක් ඉටුකරනවාට වඩා ප්‍රේම කිරීමට, එසවීමට, සේවය කිරීමට, සහ ආශිර්වාද කිරීමට උන්වහන්සේ තුල වූ ප්‍රයත්නයන්හි උසස් අධිෂ්ඨානය මතකතබා ගැනීම ඉතා වැදගත්. අනිවාර්යෙන්ම උනවහන්සේ ඔවුන්ගේ එදිනෙදා අවශ්‍යතා ගැන දැනසිටි සේක සහ ඔවුන්ගේ වර්තමාන වේදනා විඳීම් සඳහා කරුණාව දැක්වූ සේක. එබැවින් උන්වහන්සේ සුවකළා, ආහාර දුන්නා, සමාව දුන්නා සහ ඉගැන්වූ සේක. නමුත් අද දින පිපාසය ගැන සැලකිලිමත් වීමට වඩා දෙයක් කරන්නට උන්වහන්සේට උවමනා වූ සේක. (බලන්න යොහාන් 4:13-14) උන්වහන්සේ වටා සිටින අය උන්වහන්සේව අනුගමනය කිරීම (බලන්න ලූක් 18:22, යොහාන් 21:22), උන්වහන්සේව දැනගනීම (බලන්න යොහාන් 10:14; දහම සහ ගිවිසුම 132:22-24), සහ ඔවුන්ගේ දිව්‍යමය ස්වභාවයට ලඟාවීම (බලන්න මතෙව් 5:48) තෙව් 5:48) උන්වහන්සේට උවමනා වූ සේක. එය අදටත් එසේම සත්‍යයයි (බලන්න දහම සහ ගිවිසුම 67:13).

අනෙක් අයට ආශිර්වාද කිරීමට උදව් වීම සඳහා නොයෙකුත් ආකාර ගණනාවක් ඇත, නමුත් අපගේ දේවසේවයේ අවසාන අරමුණ අනෙක් අයට ගැලවුම්කරුවාණන් ගැන දැනගැනීමට සහ උන්වහන්සේ මෙන් වීමට උපකාරී කිරීම වූ විට, අපි ක්‍රියාකරමින් ලඟාවෙන්නේ අපගේ අසල්වැසියන්ට තවදුරටත් ස්වාමින්වහන්සේ ගැන ඉගැන්වීම අවශ්‍ය නොවන දිනකටයි, මන්ද අපි සියළුම දෙනා එදින උන්වහන්සේව දැන සිටිනු ඇත (බලන්න ජෙරමියා 31:34).

**ගැලවුම්කරුවාණන් හදිසි අවශ්‍යතාවයන්ගෙන් ඔබ්බට අවධානය යොමු කළ සේක**

- පුද්ගලයන් කිහිප දෙනෙක් බොහෝ දුර ගෙවා ගොස් ඔවුන්ගේ මිතුරාව අංශභාග රෝගයෙන් සුවපත් කරගැනීමට යේසුස්වහන්සේ වෙත ගෙන ගියෝය. අවසානයේදී ගැලවුම්කරුවාණන් ඒ මනුශ්‍යයාව සුවපත් කළා, නමුත් උන්වහන්සේ වඩා කැමැත්තක් දැක්වූයේ ඔහුගේ පාපයන්ට සමාව ලබාදීමටයි (බලන්න ලූක් 5:18-26).
- කාමමිත්‍යාචාරයේ හැසුරුණු කාන්තාවක් මිනිසුන් විසින් ගැලවුම්කරුවාණන් වෙත ගෙන ආ විට, උන්වහන්සේගේ

හෙළාදැකීමේ අත්හිටුවීම ඇයගේ ජීවිතය ශාරීරිකව බේරාගත් සේක. නමුත් ඇයව ආත්මිකව මුදවාගැනීමටත් උන්වහන්සේට උවමනා වුණා, ඇයට මෙසේ කී සේක "යන්න, තවත් පව් නොකරන්න" (බලන්න යොහාන් 8:2-11).

- උන්වහන්සේගේ මිතුරා වූ ලාසරස්ව සුවකරන ලෙස, මරියා සහ මාර්තා යේසුස්වහන්සේට පණිවිඩය යැවූවෝය. අනෙක් අයව බොහෝ අවස්ථාවන්හිදී සුවපත් කල යේසුස්වහන්සේ, ලාසරස් මියයන තුරුම උන්වහන්සේගේ පැමිණීම ප්‍රමාද කළ සේක. එම පවුලේ උවමනාව යේසුස්වහන්සේ දැනසිටි සේක, නමුත් ලාසරස්ව මරණයෙන් නැගිටවීම තුලින්, උන්වහන්සේගේ දේවත්වය පිළිබඳ වූ ඔවුන්ගේ සාක්ෂිය උන්වහන්සේ ශක්තිමත් කළ සේක (බලන්න යොහාන් 11: 21-27).

ඔබට මෙම ලැයිස්තුවට ඇතුලත් කළ හැකි තවත් උදාහරණ මොනවාද?

**අපට කළ හැක්කේ මොනවාද?**

අපගේ අරමුණ අනෙක් අයට ගැලවුම්කරුවාණන් මෙන් වීමට උදව් වීම නම්, අප දේවසේවය කරන ආකාරය වෙනස්වේවි. මෙම තේරුම්ගැනීම අපගේ දේවසේවා ප්‍රයත්නයන්ට උපකාරී විය හැකි ක්‍රම සමහරක් මෙන්න.

***අදහස 1: සේවය කිරීම ගැලවුම්කරුවාණන් සමග සම්බන්ධ කරන්න***

යහපත කිරීමට අපගේ සියළුම ප්‍රයත්නයන් වැදගත්, නමුත් ගැලවුම්කරුවාණන් හා සම්බන්ධවීමෙන් අපගේ සේවය පුළුල් කරගත හැකි අවස්ථා සොයාබලන්නට අපට පුළුවන්. උදාහරණයක් ලෙස, ඔබ දේවසේවය කරන පවුල අසනීප නම්, ආහාර වේලක් උපකාරී වීමට හැකිය, නමුත් ඔබගේ ප්‍රේමයේ සරල විදහා දැක්වීමක් ඔවුන් කෙරෙහි ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය පිළිබඳ ඔබගේ සාක්ෂිය මගින් විශාල වන්නට හැකියි. ගෙවත්තේ වැඩ සඳහා ඔබගේ උපකාරය අගය කරන්නට පුළුවන්, නමුත් පූජකවර ආශිර්වාදයක් පිළිනැංවීම තවත් අර්ථාන්විත විය හැකිය.

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ සණපූර්ණයේ වැඩිහිටි නීම් එල්. ඇන්ඩර්සන් මෙසේ ඉගැන්විය: "හොඳ හදවතක් ඇති පුද්ගලයෙකුට කෙනෙකුට ටයරයක් සවිකරගැනීමට උදව් කළ හැකිය, නේවාසික මිතුරෙකුව වෛද්‍යවරයෙකු වෙත ගෙන යාමට උදව් කළ හැකිය, දුකින් සිටින අයෙකු සමග දිවා ආහාරය ලබාගැනීමට, හෝ දිනය ප්‍රබෝධමත් කිරීමට සිනහවී කොහොමද යනුවෙන් ඇසීමට හැකිය.

"නමුත් පළමු පණත අනුගමනය කරන්නෙකුට ස්වභාවයෙන්ම මෙම සේවය කිරීමේ මෙම ක්‍රියාවන් එකතු වී තිබෙනු ඇත."[1]

**අදහස 2: ගිවිසුම් මාර්ගය වෙත අවධානය යොමුකරන්න**

සභාවේ සභාපති ලෙස සාමාජිකයින්ට ඇමතීමේදී, සභාපති රසල් එම්. නෙල්සන් මෙසේ කීවේය, "ගිවිසුම් මාර්ගයේ රැඳී සිටින්න." ගිවිසුම් ඇතිකරගැනීම සහ තැබීම "අපට ලැබිය යුතු ආත්මික ආශිර්වාද සඳහා දොරටුව විවෘත කරනු ඇත."[2]

පසුදවස්වල ශුද්ධවන්තයන් ලෙස, අපි බෞතීස්ම වී, ස්ථිර වී, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගෙන ඇත්තෙමු. සුදුසු පිරිමි සාමාජිකයින්ට පූජකවරය ලැබෙයි. අපගේ එන්ඩව්ඩ් වීමට සහ පවුල් ලෙස සදාකාලයටම මුද්‍රාවීමට අපි දේවමාළිගාවට යන්නෙමු. මෙම ගැලවීමේ වත්පිළිවෙත් සහ ඒවා හා බැඳුණු ගිවිසුම් අපට උන්වහන්සේ සමග සිටීම සඳහා උන්වහන්සේ මෙන් වීමට අත්‍යාවශ්‍යයය.

අපට මෙම මාර්ගයේ අන් අයට උදව් වීම සඳහා ඔවුන්ගේ ගිවිසුම් තැබීමට උදව් වීමට සහ අනාගත ගිවිසුම් සඳහා ඔවුන් සූදානම් කිරීමේ වැදගත් භූමිකාවක් ඇත.[3] ඔබ සේවය කරන පුද්ගලයන්ට හෝ පවුල් වලට ඔවුන්ට අවශ්‍ය මීලඟ වත්පිළිවෙත ලබාගැනීමට උදව් කළ හැක්කේ කෙසේද? එය තම දියණිය බෞතීස්ම කිරීමට ඇයගේ පියාව සූදානම් කිරීමක් වන්නට පුළුවන්, මීලඟට ඇතිකරගත යුතු ගිවිසුමෙන් ලැබෙන ආශිර්වාද තේරුම් කරමින් හෝ, සක්‍රමේන්තුව ලබාගැනීමෙන් අපේ ගිවිසුම් අළුත් කරගැනීමේ අර්ථාන්විත අත්දැකීම් බෙදාගනිමින් එය කළ හැකිය.

**අදහස 3: ආරාධනා කර දිරිමත් කිරීම**

සුදුසු අවස්ථා වලදී, ඔබ සලකා බලන අය සමග ඔවුන්ගේ හැරීම පිළිබඳ සහ ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට ඔවුන්ගේ ප්‍රයත්නයන් පිළිබඳ සාකච්ඡා කරන්න. ඔවුන් තුල ඇති ඔබ දකින ශක්තීන් ගැන ඔවුන් දැනුවත් කර ඒවා පසසන්න. ඔවුන් තවත් වර්ධනය විය යුතු යැයි හැඟෙන දේ සොයාගෙන, ඔබට ඒ සඳහා උදව් කළ හැකි ආකාරය පිළිබඳ කථා කරන්න. (ඔබ දේවසේවය කරන අය සමග එක්ව සාකච්ජා කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා, "ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ සාකච්ජා කරන්න," ලියහෝනා, සැප්.2018, 6-9 බලන්න.)

ගැලවුම්කරුවාණන්ව අනුගමනය කිරීමට ඔවුන්ට ආරාධනා කරන්නට බිය නොවන්න සහ ඔවුන්ගේ දිව්‍යමය තත්වය ලඟාකරගැනීමට ඔවුන්ට උදව් වන්න. ඔවුන් තුළ ඔබට ඇති විශ්වාසය සහ උන්වහන්සේ තුළ ඔබගේ ඇදහිල්ල පෙන්වීමෙන්, මෙම ආරාධනාව ජීවිතය වෙනස් කරන්නක් වේවි.

**ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි වර්ධනය වීමට අපට අන් අයට උදව් විය හැකි ආකාර හයක්**

පහත දැක්වෙන්නේ ගිවිසුම් මාවතේ ජීවිතය වර්ධනය කරගැනීමට අන් අයට උපකාරී විය හැකි යෝජනාවන්ය. (තවත් අදහස් සඳහා *Preach My Gospel* හි 11 වන පරිච්ජේදය බලන්න.)

1. **බෙදාගන්න.** අභියෝග අභිබවා සුභාරංචි මූලධර්ම තුල ජීවත්වීම තුලින් ඔබ උන්වහන්සේ වෙත ලඟාවීමට උත්සහකරන විට ගලවුම්කරුවාණන් ඔබට උදව් වූ ආකාරය පිළිබඳ බෙදාගැනීමේදී අව්‍යාජ වන්න සහ නිර්භීත වන්න.
2. **ආශිර්වාද පොරොන්දු වන්න.** වෙනස් නොවීමට වඩා වෙනස් වීමට බලකරන හේතූන් මිනිසුන්ට අවශ්‍යයි. ක්‍රියාවක් හා

සම්බන්ධ ආශිර්වාද විස්තර කිරීම බලවත් උනන්දුවක් ලබාදෙයි (බලන්න දහම සහ ගිවිසුම 130:20-21).

**3.** **ආරාධනා කරන්න.** සුභාරංචි මූලධර්මයක් මත ජීවත් වීම සාක්ෂියක් ගෙන එයි, එය සත්‍යයයි (බලන්න යොහාන් 7:17) සහ එය ගැඹුරු හැරීමකට මගපෙන්වයි.[4] සරල ආරාධනාවක් වැනි සෑම ක්‍රියාවක්ම ඔවුන්ට වර්ධනය වීම සඳහා උදව් වන යම් දෙයක් සිදුකරයි.

**4.** **එක්ව සැලසුම් කරන්න.** වෙනස්වීමට ඇති ඔවුන්ගේ කැපවීම සාර්ථකව තබාගැනීමට කුමක් සිදුවිය යුතුද? ඔබට උපකාරී විය හැක්කේ කෙසේද? ඒ සඳහා කාලසටහනක් තිබෙනවාද?

**5.** **සහය වන්න.** උපකාරී වන විට, පුද්ගලයන්ට දිරිමත්වීමට සහ සාර්ථක වීමට උපකාරී වියහැකි සහය ජාලයක් නිර්මාණය කරන්න. අප සැමදෙනාටම දිරිගන්වන නායකයෙකු අවශ්‍යයි.

**6.** **පසුවද සොයාබලන්න.** වර්ධනය සැමවිටම බෙදාගන්න. සැලැස්ම පිළිබඳ අවධානයෙන් සිටින්න නමුත් අවශ්‍ය විට එය හරිගස්වන්න. ඉවසිලිවන්ත වන්න, නොනවත්වන්න, සහ දිරිමත් කරන්න. වෙනස්වීමට කාලය ගතවේවි.

**ක්‍රියාකිරීමට ආරාධනය**

විශාල ලෙස මෙන්ම කුඩා ප්‍රමාණයෙන් - ඔබගේ දේවසේවය - අන් අයගේ හැරීම ගැඹුරු කරවීමට සහ ගැලවුම්කරුවාණන් ලෙස වීමට උදව් වන ආකාරය පිළිබඳ සිතාබලන්න.

"දේවසේවා මූලධර්ම" ලිපිය අපට අන් අය කෙරෙහි සලකා බැලීමට උපකාරී වීම සඳහා මිස - හමුවීම්වලදී බෙදාගැනීම සඳහා නොවේ. අප සේවය කරනා අය පිළිබඳ අපි දැනගත්විට, අපගේ සලකාබැලීමට සහ කරුණාවට අමතරව කුමන පණිවිඩයක් ඔවුන්ට අවශ්‍යද යන වග දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට හඟවනු ලබන සේක.

**සටහන්**

1. Neil L. Andersen, “A Holier Approach to Ministering” (Brigham Young University devotional, Apr. 10, 2018), 3, speeches.byu.edu.
2. රසල් එම්. නෙල්සන්, "අප එක්ව ඉදිරියට යන විට," ලියහෝනා, අප්‍රි. 2018, 7.
3. See Henry B. Eyring, “Daughters in the Covenant,” *Liahona*, May 2014, 125–28.
4. See David A. Bednar, “Converted unto the Lord,” *Liahona*, Nov. 2012, 106–109.

© 2019 by Intellectual Reserve, Inc. සියළුම හිමිකම් ඇවිරිණි. ඇ.එ.ජ දී මුද්‍රණය කරන ලදි. ඉංග්‍රීසි අනුමැතිය: 6/18. පරිවර්තන අනුමැතිය: 6/18. Translation of *Ministering Principles, January 2019.* Sinhala 15762 408